# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/ 153/2017 (NPC)

ටී.එම්.නිමල් තිස්ස බණ්ඩාර

**අභියාචක**

**එදිරිව**

**ජාතික පොලිස් කොමිසම**

**වගඋත්තරකරු**

දිනය :- **2025.03.27**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ටී.ගුණතිලක මහතා වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නීති නිලධාරී ටී.කේ.ආර්.පී ජයතුංග මෙනවිය සමඟ නියෝජ්‍ය අධ්‍යක්ෂක මාලා බස්නායක මහත්මිය.

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා,**

## -නියෝගය-

අභියාචක ටී.එම්.නිමල් තිස්ස බණ්ඩාර විසින් 2017.08.04 දිනැතිව ඉදිරිපත් කරන ලද අභියාචන පෙත්සම මගින් කරුණු දක්වමින් පවසා ඇත්තේ, ඔහුට එරෙහිව පවත්වා ගෙන ගිය විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව දඬුවමක් වශයෙන් වැටුප් වර්ධක දෙකක් විලම්භනය කර, රු.30,000/=ක මුදලක් ද අයකර ගැනීමට නියෝග කර ඇති බවයි. තවදුරටත් ඔහු පවසා ඇත්තේ, ඉහතකී පෙත්සමේ සඳහන් කරුණු සළකා බලා, ඔහු වෙත ලබා දී ඇති දඬුවම ඉවත් කර දෙන ලෙසයි. අභියාචක වෙත පනවා තිබූ ඉහත දඬුවම ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණයක් මත වෙනස් කරමින් රු.30,000/=ක මුදල අයකර ගැනීම සඳහා නියම කර ඇති දඬුවම ඉවත් කර ඇත. ඒ අනුව අභියාචකට

එරෙහිව දැනට බලපවත්වනු ලබන්නේ වැටුප් වර්ධක දෙකක් විලම්භනය කරමින් පනවා ඇති දඬුවම පමණකි.

ඉහත කී දඬුවම පනවා ඇත්තේ, අභියාචක වෙත ඉදිරිපත් කරන ලද, අණට අකීකරුවීම, සහ රාජකාරිය පැහැර හැරීම යන චෝදනා සම්බන්ධයෙන් පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයකින් අනතුරුව ඔහු වැරදිකරු බවට තීරණය කර ඇති බැවිනි. ඉදිරිපත් කරන ලද චෝදනා වලට පදනම වී ඇත්තේ ඩබ්.ආර්.බිසෝ මැණිකේ යන අය විසින් කරන ලද පැමිණිල්ලක් විභාග කිරීම සඳහා සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති විසින් අභියාචක වෙත යොමු කරන ලද නියෝගය අභියාචක විසින් නොසළකා හැරීමයි. මෙම කරුණු ඔප්පු කිරීම සඳහා විනය පරීක්ෂණයට සාක්ෂිකරුවන් 07 දෙනෙකු සාක්ෂි දීම සඳහා කැඳවා ඇත. විනය පරීක්ෂණය අභියාචකගේ සහභාගීත්වයෙන් යුක්තව පවත්වා ඇති අතර, ඔහු වෙනුවෙන් රැකවරණ නිලධාරියෙකු ද පෙනී සිට ඇත. විනය පරීක්ෂණය පැවැත්වූ ආකාරය සම්බන්ධයෙන් අභියාචක විසින් කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් කර නැත. විනය පරීක්ෂණයේ දී අභියාචක ද සාක්ෂි දී ඇත.

අභියාචකට එරෙහිව ඉදිරිපත් වී ඇති චෝදනාව වන්නේ සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති විසින් දෙනු ලැබූ නියෝගය ඔහු විසින් ක්‍රියාත්මක නොකර තිබීමයි. එවකට සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ ධර්මතිලක යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ කිසියම් ගැහැණු ළමයෙකුට, තිස්ස යන අයගෙන් කරදර තිබූ බවට කරන ලද පැමිණිල්ල විභාග කිරීම සඳහා ඔහු විසින් අභියාචක වෙත අදාළ පොතේ සඳහන් කර නියෝගයක් ලබා දී තිබුණ බවය. එම අවස්ථාවේ දි අභියාචක මුර සංචාරයේ යෙදී සිට බවට ද ඔහු පවසා ඇත. තවදුරටත් සාක්ෂි දෙමින් ඔහු පවසා ඇත්තේ පොත් වල තබන ලද සටහන් සහ නියෝග පරීක්ෂා කර බැලීම, ඒවා අදාළ නිලධාරීන්ගේ ක්‍රියාවක් බවත්, මුර සංචාරයේ යෙදී සිටි නිලධාරීන් පැමිණි පසු එකී නියෝග ඔවුන් විසින් සටහන් කර ගත යුතු බවත්ය. ඒ බව, ඔහු විසින් මෙසේ පවසා ඇත.

> **"සුළු පැමිණිලි ලැබුණු පසු මා විසින් පොත කියවා නියෝග යොදනවා. ඉන්පසු දිවා මුර සංචාරක නිලධාරීන් එම නියෝග කියවා ක්‍රියා කිරීමට අත්සන් යොදා කටයුතු කරනවා. .............................."**

> **"නියෝගයක් යෙදූ විට එය සටහන් කර ක්‍රියාත්මක කිරීම නිලධාරියාගේ වගකීමයි..............."**

ඉහත සාක්ෂියෙන් පෙනී යන්නේ මුර සංචාරයේ යෙදුන අභියාචක, ආපසු පොලිස් ස්ථානයට පැමිණීමෙන් අනතුරුව, ඔහු වෙත ලබාදී තිබූ නියෝග ඔහු විසින් ම පරීක්ෂා

කර බැලිය යුතු බවයි. අභියාචක එම නියෝග අනුව කටයුතු කර නොමැති බව විවාදයෙන් තොරව පිළිගෙන ඇත. විනය පරීක්ෂණයේ දී සාක්ෂි දී ඇති රඹුක්කන පොලිස් ස්ථානයේ එවකට පොලිස් ස්ථානාධිපති ලෙස කටයුතු කළ පාලිත ඩයස් යන අය ද සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේ සුළු පැමිණිලි සටහන් පොත කියවා, යොදන ලද නියෝග දිවා මුර සංචාරයේ යන නිලධාරීන් සටහන් කර ගන්නා බවත්, අනතුරුව එම නියෝග අනුව කටයුතු කරන බවත් ය. ඉහත කී සාක්ෂිකරුවන් දෙදෙනාම හරස් ප්‍රශ්න වලට භාජනය වි ඇත. ඉහත කි පොලිස් නිලධාරීන් දෙදෙනාගේ සාක්ෂි හරස් ප්‍රශ්න වලදී බිඳ හෙලා නොමැත. ඒ අනුව සුළු පැමිණිලි පොතේ සහ අනිකත් ලේඛන වල යොදන ලද සටහන් පරීක්ෂා කර බලා, ඒවායෙහි කිසියම් නිලධාරියෙකුට නියෝගයක් දී ඇත්නම් එය සටහන් කර ගෙන, ඒ අනුව කටයුතු කිරීම ඔවුන්ගේ වගකීම බව පැහැදිලි වේ.

අභියාචක පවසා ඇත්තේ, ඔහු රඹුක්කන පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි අංශයට අනුයුක්තව රාජකාරියේ යෙදී සිටියදී වෙනත් රාජකාරි සඳහා විවිධ අවස්ථාවන් වලදී යොදවනු ලබන බවයි. මෙම සිද්ධිය සම්බන්ධයෙන් අභියාචක විසින් පවසා ඇත්තේ, **2008.06.01** දින තබන ලද නියෝගය ඔහුට කිසිවෙකු පෙන්වා නොදුන් නිසා, එය ඔහු විසින් සටහන් කර ඒ අනුව ක්‍රියා නොකළ බවයි. මෙයින් පෙනී යන්නේ අභියාචකගේ ස්ථාවරය වන්නේ අදාළ නියෝග ඔහු වෙත විශේෂයෙන් පෙන්වා දිය යුතුව තිබුණ බවයි.

නමුත් ස්ථානාධිපතිවරයා සහ සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති යන සාක්ෂිකරුවන් දෙදෙනාම පැහැදිලි ලෙස සඳහන් කර ඇත්තේ අභියාචක පවසන අන්දමට වෙන් වෙන්ව ඔවුන් වෙත නියෝග විශේෂ වශයෙන් දැනුම් දීමක් නොකරන බවයි. ඉහත කී සාක්ෂිකරුවන් දෙදෙනාම එකම ආකාරයට දෙනු ලබන සාක්ෂිය මෙහිදී පිළිගැනීමට සිදුවේ. ඒ අනුව අභියාචක විසින් ගනු ලැබූ ස්ථාවරය ප්‍රතික්ෂේප කරමි.

ඉහත කරුණු අනුව පෙනී යන්නේ අභියාචක විසින් ඔහු වෙත ලබාදී තිබූ නියෝග ක්‍රියාත්මක කිරීම ඔහු විසින් පැහැර හැර ඇති බවයි. මේ තත්ත්වය යටතේ, ඉදිරිපත් වී ඇති චෝදනා වලට අභියාචක වරදකරු කරමින් කරන ලද තීරණයෙහි දෝෂයක් පෙනෙන්නට නැත. ඒ අනුව එම තීරණය, ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක විය යුතු බවට තීරණය කරමි.

කෙසේ වෙතත් අභියාචක ඔහුගේ අභියාචනා පෙත්සමේ සහ වාචිකව ඉදිරිපත් කරන ලද කරුණු වලදී සඳහන් කර සිටියේ මෙම සිද්ධියේ දී ම, මෙම කරුණටම අදාළව චෝදනා ඉදිරිපත් කර, එම චෝදනාවන්ට වරදකරු වූ බී.ආර්.විජේරත්න බණ්ඩා යන පොලිස් සැරයන්වරයාට දි ඇති දඩුවම **"තදින් තරවටු කිරීමක්"** පමණක් බවයි. ඒ අනුව

ඔහු ඉල්ලා ඇත්තේ එකම සමාන වරදකට දෙයාකාරයකින් සළකා කටයුතු කිරීම වැරදි සහගත බවයි.

ඉහත කී කරුණු කෙරෙහි විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදි. එකම වරදක් සඳහා දෙයාකාරයකින් කටයුතු කර තිබීම නිවැරදි නොවේ. තවද අභියාචක දන්වා සිටියේ ඔහුට එරෙහිව වෙනත් දෝෂ දර්ශනයක් හෝ නිකුත් කර නොමැති බවයි. තවද ඔහු දීර්ඝ කාලයක් පොලිස් නිලධාරියෙකු ලෙස සේවය කරන ලද බවත්, ඔහු වෙත ලබා දී ඇති දඬුවම නිසා ඔහුගේ සියලුම උසස්වීම් අහිමි වී ගොස් ඇති බවටද, ඔහු කරුණු දක්වා ඇත.

අභියාචක විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් කරුණු, වැරදි සහගත ඒවා බවට කරුණු ඉදිරිපත් නොවේ. ඒ අනුව එම කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් අභියාචක වෙත ලබාදී ඇති වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීමට ලබදී ඇති දඬුවම ඉවත් කිරීමට තීරණය කරමි. එකී දඬුවම වෙනුවට අභියාචක වරදකරු බවට පත්වී ඇති චෝදනාවන්ට දඬුවමක් ලෙස ආයතන සංග්‍රහයේ 2 කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 24: 2 හි සඳහන් කර ඇති සුළු දඬුවමක් ලෙස සළකනු ලබන, 24 : 2 : 2 වගන්තියේ සඳහන් **"තදින් තරවටු කිරීම"** යන දඬුවම පැනවීමට නියම කරමි.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචකගේ අභියාචනය නිශ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-